# සතුටු ගෙදර



දෙසඳි චිරන්යා නවරත්න

**කෘතියේ නම :- සතුටු ගෙදර**

**කතෘගේ නම :- දෙසඳි චිරන්යා නවරත්න (3E)**
**මහමායා බාලිකා විදුහල**
**මහනුවර**

**කෘතිය පළකරන දිනය : 2023.11.15**

## පිදුම

**මගේ සතුටු ගෙදර නම් කෘතිය මාගේ දෙමව්පියන්ටත්**

**පාසලේ විදුහල්පතිනිය ඇතුළු ගුරු භවතුන් වෙත**

**දයාබරත්වයෙන් පිළිගන්වමි.**

# පෙර වදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයටද අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කරගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේකඛ අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පැසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට

සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධායන කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙමකෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවාය ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය, ගරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනැමේ.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විදුහල
මහනුවර
**2023.11.01**



# <u>සතුටු ගෙදර</u>

එකමත් එක රටක කුඩා ගමක පුංචි නිවසක් තිබුණා.

එහි සිටියේ තාත්තයි, අම්මයි, නංගියි, අයියයි.

එක දවසක් ගමට තද කුණාටුවක් හැමුවා.

එවිට අයියයි, නංගියි ගොඩක් බය වුණා.

එවිට අයියයි, නංගිව අම්මයි තාත්තයි තුරුළු කර ගත්තා.



එක්වරම නිවසේ වහලය ගසාගෙන ගියා.

එවිට අම්මා මෙසේ විලාප තැබුවා.

“අනේ අපි අමාරුවෙන් හදාගත්ත ගෙයි වහලය”

“අනේ නෝනේ කලබල නොවී ඉන්න”

තාත්තා එසේ පැවසුවා.



අයියා: අනේ අපි වැස්සෙන් තෙමෙනවා.

දැන් අපි මොකද කරන්නේ?

නංගී: අනේ අයියේ මටත් බයයි.

තාත්තා : මේ වෙලාවේ කොහෙටවත් යන්න බෑ.

අම්මා : ඒ වුණාට අපි ඔක්කොමයි, ගෙදර බඩුයි තෙමෙනවා.

තාත්තා: ඔක්කෝටම කලින් ආරක්ෂිත තැනකට යමු.




ඉන් පසුව පවුලේ සැමදෙනා තම තමන්ගේ භාණ්ඩද රැගෙන පන්සල වෙත ගියා. "අනේ හාමුදුරුවනේ අද ආපු තද කුණාටුවට අපේ ගෙයි වහලේ ගසාගෙන ගියා" යැයි තාත්තා පැවසුවා.

හාමුදුරුවන් : ඔයාලට අද මම ඉන්න තැනක් දෙන්නම්.

අම්මා : බොහොම පිං.

හාමුදුරුවන් : අදට බණ ගෙදර නවතින්න.

සැමදෙනා බණ ගෙදර රැය ගත කළා. පසුදා උදෑසනම අම්මයි, තාත්තයි අවදි වුණා. ඒ වන විට වැස්ස අඩුවී හිරු රැස් වැටී තිබුණා.



එවිට තාත්තයි, අම්මයි, අයියයි, නංගියි පන්සලෙන් පිටත් වුණා.

ගමේ හැමෝම එයාලගේ නිවස වෙත පැමිණියා.
එයාලට වුණ විපත ගැන හැමෝම දුක්වුණා.
ගමේ කිහිප දෙනෙක් එකතු වී ආහාර පාන සාදා දුන්නා.

තාත්තා මේ හැමෝටම ස්තූති කළා.

ගමේ හැමෝම එකතු වී වැස්සෙන් තෙමී ඇති නිවස පිරිසිදු කළා.
ගමේ වඩු බාස් ඉදිරිපත් වී වහලය සාදා දීමට පොරොන්දු වුණා.



පසුදා උදෑසනින්ම තාත්තා වහලයට බඩු සෙවීමට පිටත් වුණා.

අම්මයි, අයියයි, නංගියි ගේ පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත වුණා.

මේ අතරතුර වඩු බාස් ගෙදරට පැමිණියා.

අම්මා: ආ....... බාස් උන්නැහේ දැන්ද ආවේ,

වඩු බාස්: ඔව් මම දැන් ආවේ. මහත්තයා කෝ?

අම්මා: මහත්තයා වහලයට බඩු ගේන්න ගියා.

වඩු බාස්: එන්න වෙලා යයිද දන්නේ නෑ?

අම්මා: පොඩ්ඩක් විතර වෙලා යයි. තේ ටිකක් බීල ඉමු.

වඩු බාස්: තේ ටිකක් බීලම වැඩ පටන් ගමු.



ටික වේලාවකින් තාත්තා පැමිණියේය.

තාත්තා: ආ..... බාස් උන්නැහැ ඇවිල්ලා ගොඩක් වෙලාද?

වඩු බාස්: ඔව් ටිකක් වෙලා.

තාත්තා : ලී නම් ටිකක් ගෙනාවා.


වඩු බාස්: ඔය ටික නම් මදි වෙයි. අපි තව ටිකක් හොයා ගන්න බලමු.

තාත්තා: පන්සලේ හාමුදුරුවොත් ලී ටිකක් දෙන්නම් කිව්වා.

වඩු බාස්: අපි පන්සලේ ලී ටිකත් බලලා හෙටම වැඩේ පටන් ගමු.

තාත්තා: එතකොට අපි හෙට වෙනකන් ඉන්නෙ කොහෙද?

අම්මා: පන්සලේ හාමුදුරුවෝ අදත් රෑට පන්සලට එන්න කීවා.



ඉන් පසු පවුලේ සැම දෙනාම පන්සල වෙත පිය නැගුවා.

එදිහී පන්සලේ හාමුදුරුවන් වහලයට අවශ්‍ය ලී බඩු ටික

ලබා දීමට කටයුතු කළා.

පසුදින උදෑසනම සියලු දෙනාම නිවසට පැමිණියා.

එදින උදෑසනම අසල්වාසීන් ඔවුන්ට උදෑසන ආහාර

ලබා දුන්නා.

ඒ සියළු දෙනාටම ඔවුන් ස්තූති කළා.

වඩු බාස් ඒ සමගම නිවසට පැමිණියා.



ගමේ පිරිමි අය සියලු දෙනා වහලය සෑදීමට උදවු කළා.

සියළු දෙනාගේම මහන්සිය නිසා වහලය සාදා නිම කළා.

අයියයි, නංගියි, ඇස්වලට සතුටු කඳුළු පිරුණා.

තාත්තයි, අම්මයි වඩු බාස්ටත්, ගමේ සියලු දෙනාටම ස්තූති කළා.

අයියටයි, නංගිටයි ගොඩක් සතුටුයි.

එයාලගේ නිවස පෙර තිබූ තත්වයට පත් වුණා.

"අපි අද හවසට පන්සලට ගිහින් හාමුදුරුවන්ටත් ස්තූති කරලා එමුයි" තාත්තා කීවේය.

එහෙනම් අපි හවසට බෝධි පූජාවකුත් තියලම එමු.



එහෙනම් කට්ටියම නාලා පිරිසිදු වෙන්න.

අයියයි, නංගියි සතුටින් නෑමට ගියා.

සවස් වරුවේ තෙල්, මල්, හඳුන්කූරු ආදිය දේ රැගෙන සියලු දෙනා පන්සල වෙත පිය නැගුවා.

පන්සල වෙත ගොස් හාමුදුරුවන්වත් බැහැ දුටුවා.

හාමුදුරුවන්ට වැද නමස්කාර කර නිවසේ වැඩ අවසන් කළ බව හාමුදුරුවන්ට දැන්වූවා.

හාමුදුරුවන්ද සිය සතුට පළ කළා.



ගමේ හැමෝම සහයෝගය දුන් නිසා නිවසේ වැඩ කටයුතු සාර්ථකව නිමකර ගැනීමට හැකි වූ බව හාමුදුරුවන් පෙන්වා දුන්නා.

එලෙසම ගමේ වෙනත් අයෙකුට කරදරයක් වූ විට උදවු කිරීමට පවුලේ සියළු දෙනා හාමුදුරුවන්ට පොරොන්දු වූණා.

බෝධි පූජාව නිම වූ පසු පවුලේ සියළු දෙනා සතුටින් නිවසට පැමිණියෝය.

නිමි.



## පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි විවිධ බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාප අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ම මෙවර ජාත්‍යාන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැදුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලැබදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම, ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැටපතකි. මෙම

නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරියක් වීමට ශක්තිය ලැබේවායි පතමු.......

මෙයට,

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**

ISBN

ISBN 978-624-206-878-7